වෙස්සගිරිය විහාරයේ සිතුවම් පිළිබඳ අධ්‍යයනයක්

රොෂාන් ප්‍රසන්න බණ්ඩාර[30]

අනුරාධපුර ශ්‍රී මහා බෝධිය අසලින් දිවෙන අනුරාධපුර කුරුණෑගල මාර්ගයේ පොතාන හන්දිය අසල පිහිටා ඇති වෙස්සගිරිය නම් පුදබිම ඉමහත් ප්‍රසිද්ධියට පත් ස්ථානයකි. මහාවංසයේ සඳහන් ආකාරයට මෙම ස්ථානය මිහිදු හිමියන්ගෙන් පැවිදිබව ලැබූ 500ක් භික්ෂූන් වහන්සේලා වැඩවාසය කළ බව කියවේ. වර්තමානයේ වෙස්සගිරිය ලෙස හැඳින්වුවත් එහි නියම නාමය "**ඉසුරුමෙනු විහාරය**" බව ශිලා ලේඛන ඔස්සේ තොරතුරු අනාවරණය කරගත හැකි ය. මෙහි හමුවී ඇති ක්‍රි.ව 10වැනි සියවසට පමණ අයත් යැයි සැලකෙන පුවරු ලිපියක "බෝ උපුල්වන් කසුබ්ගිරි රද්මහ වෙහෙර" යන නාමයද සඳහන්වී තිබේ. ඒ මඟින් වෙස්සගිරිය යන නාමය එ කළ භාවිත වී ඇති බවට සාක්ෂි හමු වේ. තවද වෙස්සගිරි විහාරයේ වෛශ්‍ය කුලයට අයත් 500ක් මෙහි විසූ බැවින් මෙය "**වෙස්සගිරිය**" ලෙස හැඳින්වූ බවට ද මතයක් පවතී. වර්ථතමානයේ අක්කර 20ක් පමණ භූමි භාගයකින් යුක්ත මෙම විහාරයේ නිර්මාතෘ ලෙස සලකනු ලබන්නේ දේවානම්පියතිස්ස රජතුමාය.(ක්‍රි.පූ 247-297) මොහුට පසුව මෙම විහාරය අවස්ථා කිහිපයකදී රජවරු කිහිපදෙනෙකු අතින් ප්‍රතිසංස්කරණය වී ඇති අතර වසභ රජුගේ කාලයේ මෙහි උපෝස්ථාගාරයක් ද, වෝහාරික තිස්ස රජු දවසේ මෙම විහාරය වටා පවුරක් ද, කාශ්‍යප රජතුමා මෙම විහාරය ප්‍රතිසංස්කරණය කළ බවටද තොරතුරු හඳුනාගත හැකි ය.තැන තැන විසිරුණු ගල් ගුහා රාශියක් සමන්විත භූමියක් වන වෙස්සගිරිය එකල ආරාම සංකීර්ණයක් ලෙස පවතින්නට ඇතැයි අනුමාන කෙරේ. වෙස්සගිරිය ප්‍රධාන ගුහාවේ ගලින් නිර්මාණය කළ පියගැටපෙළ පසුකර ගුහාවට ඇතුළු වූ විට දකුණු පැත්තෙහි ගලේ බොහෝ දෙනෙකුගේ සැලකිල්ලට භාජනය නොවූ කාල දෙකකට අයත් බිතුසිතුවම් දැකගත හැකි ය. මෙම සිතුවම් අතර කාන්තා රූපයක් පැහැදිලිව හඳුනාගත හැකි අතර තවත් මුහුණුවල කොටස් කිහිපයක් තැන් තැන්වල දැකගත හැකි ය. මෙම හඳුනාගත හැකි සිතුවම් තුළ කොටස් කිහිපයක් දැකිය හැකි වුවත් එම චිත්‍රයන්ගෙන් කුමක් අදහස් වේදැයි නිශ්චිතව කිව නොහැකි ය. මල් අතින්ගත් රූප, වැඳගෙන සිටින රූප, වාඩිවී සිටින කාන්තා රූපයක්ද මෙහි දැකගත හැකිය. මෙම සිතුවම් සීගිරි සිතුවම්වලට බෙහෙවින් සමාන කමක් දක්වන අතර ඇතැම්විට ගුප්ත සමයේ ලක්ෂණද මෙහි අන්තර්ගත බැවින් මෙහි කාල නිර්ණය ගැටළු සහගත වී ඇත.මෙහි දක්නට ලැබෙන සිතුවම් පිළිබඳව අංශ කීපයක් ඔස්සේ අධ්‍යයනය කළ හැකි ය. මෙම සිතුවමට පදනම් වූ බදාම ස්තරය, වර්ණ භාවිතය, මානව රූප, ස්භාවික රූප, හැඩතල, ආභරණ භාවිතය, රේඛා භාවිතය, ශෛලිය, ඇඳුම් පැළඳුම් ආදිය පිළිබඳව තොරතුරු අධ්‍යයනය කරමින් වෙස්සගිරියේ සිතුවම් පිළිබඳ විධිමත් අධ්‍යයනයක් කිරීමට අපේක්ෂා කරයි. අනුරාධපුර යුගයට අයත් වෙස්සගිරි සිතුවම් 1972 දී සීගිරි සිතුවම් සංරක්ෂණය කළ ලුසියානා මරන්සි විසින්ම සංරක්ෂණය කර ඇති අතර නැවත 1984 දී ද මෙම සිතුවම් සංරක්ෂණය කර ඇත. ඉන් පසුව සිතුවම්වලට වන හානිය අවම කිරීමට යකඩ වැටක්ද යොදා ඇත. වෙස්සගිරි සිතුවම් අපේ ඉතිහාසය පිළිබඳ දීර්ඝ ඉතිහාස කතාවක් ප්‍රකාශකරන බැවින් ඒ පිළිබඳ අධ්‍යයනය කිරීම වැදගත් වේ.

ප්‍රමුඛ පදඃ වෛශ්‍ය කුලය,ඉසුරුමෙනු, කසුබ්ගිරි, විහාර සිතුවම්

[30]ඉතිහාස අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.